සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## ගණිතය - I

නම / විභාග අංකය : ................................................................................................ කාලය පැය 02 යි

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- A කොටසේ 1 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 1 බැගින් ද 11 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 2 බැගින් ද හිමි වේ.
- B කොටසේ එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

### A කොටස

01. පැන්සලක මිල රු. 7.50 කි. එවැනි පැන්සල් 10 ක මිල කීය ද?

02. 1.75kg ක් ග්‍රෑම් වලින් දක්වන්න.

03. විසඳන්න $x - 3 = 5$

04. රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් a හි අගය සොයන්න.




05. සුළු කරන්න. $a^3 \times a^5$

06. ඛණ්ඩාංක තලය මත නිරූපණය කර ඇති AB හා CD රේඛා සමාන්තර වේ. AB රේඛාවේ සමීකරණය $y = 2x + 1$ නම් CD රේඛාවේ සමීකරණය ලියා දක්වන්න.



07. 4 හා 10 අතර සමාන්තර මධ්‍යන්‍ය සොයන්න.

08. 5, 6, 6, 7, 7, 7, 9, 9, 11 යන දත්ත සමූහයේ පරාසය සොයන්න.

09. මිරිස් ඇට අසුරා ඇති පැකට්ටුවක ඇටයක් පැලවීමේ සම්භාවිතාව $\frac{7}{9}$ ක් බව සඳහන් කර ඇත. සිටුවන ලද මිරිස් ඇටයක් පැල නොවීමේ සම්භාවිතාව කීය ද?

10. $\frac{3}{5}$ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

11. $101_{\text{දෙක}} + 11_{\text{දෙක}}$ සුළු කරන්න.

12. $0.96 \div 1.2$ සුළු කරන්න.

13. $x$ හි අගය සොයන්න.




14. $2x - 1 < 5$ අසමානතාවයට ගැලපෙන ධන පූර්ණ සංඛ්‍යාමය විසඳුම් ලියා දක්වන්න.

15. රූපයේ දී ඇති දත්ත අනුව පහත කෝණවල විශාලත්වය සොයන්න.




i) $x =$

ii) $y =$

16. පහත ප්‍රසාරණයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

$(x + ........)^3 = x^3 + ............ + 12x + 8$

17. පුද්ගලයෙක් රු. 10/= කොටස් රු. 9/= බැගින් මිලදී ගැනීම සඳහා රු. 36 000/= ක් ආයෝජනය කරයි.

i) මිලදී ගත් කොටස් ගණන කීය ද?

ii) එම කොටස්වල නාමික අගය කීය ද?

18. O කේන්ද්‍රය වූ වෘත්තයේ අරය 13cm කි. O සිට AB ජ්‍යායට ඇඳි ලම්බය OX වේ. OX = 5cm නම්, AB ජ්‍යායේ දිග සොයන්න.




19. මූල ලෙස 0 හා -2 යන විසඳුම් ලැබෙන වර්ගජ සමීකරණය ලියන්න.

20. වෙළෙන්දෙක් කිසියම් භාණ්ඩයක් රු. 760 කට විකුණනු ලබන්නේ 5% ක වට්ටමක් සහිතව නම්, භාණ්ඩයේ ලකුණු කර ඇති මිල කීය ද?

21. රූපයේ BC // DE වේ. AB = 8cm ද AD = 6cm ද AE = 4.8cm ද නම්, CE දිග ගණනය කරන්න.




22. සාධක සොයන්න. $a^3 - 9a$

23. රූපයෙන් දැක්වෙන්නේ 1 : 200 පරිමාණයට අඳින ලද ගොඩනැගිල්ලක බිම් සැලැස්මකි. ගොඩනැගිල්ලේ පරිමිතිය සොයන්න.




24. $4\sqrt{3} - \sqrt{27}$ සුළු කරන්න.

25. පංචාස්‍රයේ දී ඇති තොරතුරු ඇසුරින් $x$ හි අගය සොයන්න.




26. $x = \sqrt{y-1}$ නම්, $y$ උක්ත කරන්න.

27. O කේන්ද්‍රය වූ වෘත්තයට A බාහිර ලක්ෂ්‍යයේ සිට AB හා AC ස්පර්ශක ඇඳ ඇත.




i) $A\hat{B}O$ හි අගය කීයද?

ii) AB හා AC අතර සම්බන්ධයක් ලියා දක්වන්න.

---

28. 72 $kmh^{-1}$ වේගයෙන් ගමන් කරන මෝටර් රථයක් තත්පර 5 ක් තුළ ගමන් ගන්නා දුර මීටර කීය ද?

---

29. AB යනු වෘත්ත චාපයකි. එම චාපය අයත් වෘත්තයේ කේන්ද්‍රය සෙවීම සඳහා කළ යුතු ජ්‍යාමිතික නිර්මාණයක දළ සටහනක් ඇඳ දක්වන්න.




---

30. භාජනයක 1, 2, 3, 4, 5 යන අංක ලියූ කාඩ්පත් 5 ක් ඇත. භාජනයෙන් එක්වරකට කාඩ්පත් දෙක බැගින් ඉවතට ගෙන ඉලක්කම් දෙකකින් යුත් සංඛ්‍යා පිළියෙල කරනු ලැබේ. එසේ පිළියෙල කල හැකි එකිනෙකට වෙනස් මුළු සංඛ්‍යා ගණන කීය ද?

## B කොටස

ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. a) සුළු කරන්න. $\left(\frac{3}{4}+\frac{2}{5}\right)\div 3\frac{5}{6}$

b) විදුලි උපකරණ ආනයන කරුවෙක් රු. 6000/- ක් වටිනා විදුලි පංකාවක් ආනයනය කිරීමේ දී 15% ක තීරු බදු ප්‍රතිශතයක් ගෙවන ලදී. විදුලි පංකාව විකිණීමේ දී 10%ක ලාභයක් ලැබීමට ඔහු අපේක්ෂා කරයි.

i) විදුලි පංකාව සඳහා ගෙවන ලද තීරු බදු මුදල කීයද?

ii) තීරු බදු අය කිරීමෙන් පසු විදුලි පංකාවේ වටිනාකම කීයද?

iii) ආනයනකරු විසින් විදුලි පංකාව විකිණීම සඳහා අපේක්ෂිත මිල කීයද?

02. ආදර්ශ ගෙවත්තක මිරිස්, එළඹු හා අල වගාකර ඇති බිම් ප්‍රමාණය අතර අනුපාතය 4 : 1 : 3 වේ.

i) මිරිස් වවා ඇති බිම් ප්‍රමාණය වගාකර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් කිනම් භාගයක් ද?

ii) එළඹු වවා ඇති බිම් කොටස මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

iii) අල වගාකර ඇති බිම් ප්‍රමාණය $60m^2$ නම්, මිරිස් හා එළඹු වගාකර ඇති බිම් ප්‍රමාණ වෙන වෙනම ගණනය කරන්න.

iv) තවත් $20m^2$ ක බිම් ප්‍රමාණයක එළඹු වගා කලහොත් එවිට මිරිස්, එළඹු, අල වගාකර ඇති බිම් ප්‍රමාණ අතර අනුපාතය සරලම ආකාරයෙන් ලියා දක්වන්න.

03. දිනක් තුළ වෙළඳ සැලකට පැමිණි පාරිභෝගිකයන් පිරිසක් මිලදී ගත් ද්‍රව්‍ය කිපයක් පිළිබඳ තොරතුරු වෙන් රූපයේ දැක්වේ.

S = { සීනි මිලදී ගත් පාරිභෝගිකයන් }
M = { කිරිපිටි මිලදී ගත් පාරිභෝගිකයන් }
R = { සහල් මිලදී ගත් පාරිභෝගිකයන් }




i) වෙළඳ සැලට පැමිණි මුළු පාරිභෝගිකයන් ගණන 50 ද සීනි හා කිරිපිටි මිලදී ගත් පාරිභෝගිකයන් ගණන 9 ක් ද වූ අතර දෙදෙනෙක් ඉහත ද්‍රව්‍ය කිසිවක් මිලදී නොගත්හ. එම තොරතුරු ඇසුරින් වෙන් රූපයේ හිස්තැන් පුරවන්න.

ii) සීනි මිලදී ගත් පාරිභෝගිකයන් ගණන කීයද?

iii) කිරිපිටි පමණක් මිලදී ගත් අය දැක්වෙන ප්‍රදේශය අඳුරු කර දක්වන්න.

iv) ඉහත (iii) දැක්වෙන ප්‍රදේශය කුලක අංකනයෙන් ලියා දක්වන්න.

v) සීනි මිලදී ගත් අය අතුරින් අහඹු ලෙස තෝරාගත් අයකු කිරිපිටි මිලදී ගත් පාරිභෝගිකයකු වීමේ සම්භාවිතාව සොයන්න.

---

04. රූපයේ දැක්වෙන්නේ PQR නම් සෘජුකෝණී සමද්විපාද ත්‍රිකෝණාකාර ලෝහ තහඩුවකින් SRT නම් කේන්ද්‍රික ඛණ්ඩයක් කපා ඉවත් කර ඇති ආකාරයයි. PR = QR = 15cm ක්ද කේන්ද්‍රික ඛණ්ඩයේ අරය 7cm ක්ද වේ.




i) PQ පාදයේ දිග ගණනය කර කරණී ආකාරයෙන් දක්වන්න.

ii) ත්‍රිකෝණාකාර තහඩුවේ වර්ගඵලය ගණනය කරන්න.

iii) SRT කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය ගණනය කරන්න.

iv) ලෝහ තහඩුව ඒකාකාර ඝනකමින් යුක්තවන අතර එහි $1cm^2$ ක කොටසක ස්කන්ධය 10g ක් නම් කේන්ද්‍රික ඛණ්ඩය කපා ඉවත්කල පසු තහඩුවේ ඉතිරි කොටසේ ස්කන්ධය ගණනය කරන්න.

05. 50 න් ලකුණු ලබාදුන් ඇගයීමකදී සිසුන් කණ්ඩායමක් විසින් ලබාගත් ලකුණු ගණන පිළිබ තොරතුරු ඇතුලත් අසම්පූර්ණ සංඛ්‍යාත වගුවක් හා ජාලරේඛයක් පහත දැක්වේ. ළමුන් ලකුණු ලබාගෙන ඇත්තේ 5 ත් 45 ත් අතර පරාසය තුල වේ.

| පන්ති ප්‍රාන්තර (ලකුණු) | සංඛ්‍යාතය (සිසුන් ගණන) |
|---|---|
| 5 - 15 | ------ |
| 15 - 20 | 06 |
| 20 - 25 | ------ |
| 25 - 30 | 09 |
| 30 - 45 | 15 |




i) ලකුණුවල මාත පන්තිය කුමක්ද?

ii) ජාල රේඛය ඇසුරින් වගුවේ හිස්තැන් පුරවන්න.

iii) වගුව ඇසුරින් ජාල රේඛයේ ඉතිරි තීර සම්පූර්ණ කරන්න.

iv) ජාල රේඛය මත සංඛ්‍යාත බහු අස්‍රය අඳින්න.

v) ලකුණු 25 ට අඩුවෙන් ලබා ගත් සිසුන්ගේ ප්‍රතිශතය 50% ඉක්මවන බව පෙන්වන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## ගණිතය - II

නම / විභාග අංකය : ........................................................................................ කාලය පැය $02^1/_2$ යි

- A කොටසින් ප්‍රශ්න 5 ක් හා B කොටසින් ප්‍රශ්න 5 ක් තෝරාගෙන ප්‍රශ්න 10 කට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.
- අරය r ද උස h ද වූ සිලින්ඩරයක පරිමාව $\pi r^2 h$ මගින් ද අරය r වූ ගෝලයක පරිමාව $\frac{4}{3}\pi r^3$ මගින් ද ලැබේ.

### A කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. a) වෙළඳ සැලකින් රු. 15 000/- ක් වටිනා භාණ්ඩයක් මිලදී ගැනීමේදී මුලින් රු. 5000/- ක් ගෙවා ඉතිරිය රු. 1000/- බැගින් සමාන මාසික වාරික 12 කින් ගෙවා නිම කිරීමට ලබා ගත හැක.

i) මූලික ගෙවීමෙන් පසු ගෙවීමට ඉතිරි වන ණය මුදල කොපමණද?
ii) වාරික ලෙස ගෙවිය යුතු මුළු මුදල කොපමණද?
iii) ණය සඳහා ගෙවීමට සිදුවන මුළු පොළිය කොපමණද?
iv) ගෙවිය යුතු මුළු පොළිය ණය මුදලේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

b) වයස අවුරුදු 40 ක පුද්ගලයෙක් වසර 15 ක් සඳහා ජීවිත රක්ෂණාවරණයක් ලබා ගැනීමේ දී රු. 1000/- ක රක්ෂිත මුදලක් සඳහා ගෙවිය යුතු වාර්ෂික වාර මුදල රු. 90/- කි. ඔහු විසින් රු. 100 000/- ක රක්ෂිත මුදලක් ලබා ගැනීම සඳහා ගෙවිය යුතු මාසික වාර මුදල කොපමණද?

02. a) $y = x(x - 2) - 1$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීමට පිළියෙල කල අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| x | -2 | -1 | 0 | 1 | 2 | 3 | 4 |
| y | 7 | ------ | -1 | -2 | -1 | ------ | 7 |

i) මෙම වගුව උත්තර පත්‍රයට පිටපත් කරගෙන හිස්තැන් පුරවන්න.
ii) $x$ හා $y$ අක්ෂ සඳහා සුදුසු පරිමාණ තෝරාගෙන ප්‍රස්තාර කඩදාසිය මත ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

b) ප්‍රස්තාරය භාවිතයෙන්
i) සමමිතික අක්ෂයේ සමීකරණය ලියන්න.
ii) වර්තන ලක්ෂයේ ඛණ්ඩාංකය ලියන්න.
iii) ශ්‍රිතය ඍණව අඩුවන $x$ හි අගය පරාසය ලියන්න.

c) ප්‍රස්තාරය ඇසුරින් $y = x(x - 2) - 3$ ශ්‍රිතයේ අවම අගය අපෝහනය කරන්න.




03\. a) විසඳන්න, $\dfrac{m+2}{2} - \dfrac{m}{4} = 3$

b) i) රූපයේ දී ඇති ABCD ත්‍රපීසියමේ වර්ගඵලය $12cm^2$ නම් $x$ ඇසුරින් $x^2 + 8x - 24 = 0$ සමීකරණය ලැබෙන බව පෙන්වන්න.

ii) වර්ග පූර්ණයෙන් හෝ අන් ක්‍රමයකින් $x^2 + 8x - 24 = 0$ වර්ගජ සමීකරණය විසඳා $x$ හි අගය සොයන්න. ($\sqrt{10} = 3.16$ ලෙස ගන්න)

04\. a) සුළු කරන්න.

$$\frac{3}{x-2} - \frac{2}{x+2}$$

b) $A + B = \begin{bmatrix} 3 & 4 & 2 \\ 2 & 0 & -2 \end{bmatrix}$ ද $B = \begin{bmatrix} 1 & 3 & 2 \\ 4 & -1 & 0 \end{bmatrix}$ ද නම්,

A න්‍යාසය ලියන්න.

c) පහත සඳහන් සමගාමී සමීකරණ යුගලය විසඳන්න.

$$3a + 2b = 12$$

$$a - \frac{b}{3} = 1$$

05\. අළුතින් මුද්‍රණය කරන ලද පොතක පිටු 40 ක් පරීක්ෂා කිරීමේ දී සොයාගත් මුද්‍රණ දෝෂ පිළිබඳ තොරතුරු පහත ව්‍යාප්තියේ දැක්වේ.

| පිටුවක තිබූ දෝෂ ගණන | 1 - 5 | 6 - 10 | 11 - 15 | 16 - 20 | 21 - 25 | 26 - 30 | 31 - 35 |
|---|---|---|---|---|---|---|---|
| පිටු ගණන | 2 | 5 | 7 | 10 | 8 | 5 | 3 |

i) පිටුවක අඩංගු වන මධ්‍යන්‍ය දෝෂ ගණන ආසන්න පූර්ණ සංඛ්‍යාවට ගණනය කරන්න.

ii) ඉහත සඳහන් පොතෙහි පිටු 200 ක් අඩංගු නම්, මුළු පොතෙහි තිබිය හැකි යැයි අපේක්ෂා කළ හැකි මධ්‍යන්‍ය දෝෂ ගණන කොපමණද?

iii) මෙම පොතෙහි මුල් පිටු 40 තුල ඇති මුද්‍රණ දෝෂ ගණන අවම වශයෙන් 650 ක් පමණ විය හැකි බව විචාරකයෙක් පවසයි නම්, ඔබ ඔහු හා එකඟ වන්නේ ද?

06\. a) සමතල බිමක පිහිටි A නම් ලක්ෂයක දී ළමයෙකුට ඔහු ඉදිරියෙන් පිහිටි ගොඩනැගිල්ලක මුදුන $25^0$ ක ආරෝහන කෝණයකින් දිස් විය. ඔහු A සිට ගොඩනැගිල්ලට හරි කෙළින් 25mක් ගොඩනැගිල්ල දෙසට ගමන් කර B නම් ලක්ෂ්‍යයකට පැමිණි විට එහි මුදුන දිස්වූයේ $60^0$ ක ආරෝහණ කෝණයකිනි.

i) 1cm න් 5m ක් දැක්වෙන සේ ඉහත පිහිටීම් ඇතුලත් පරිමාණ රූපයක් අඳින්න. (ළමයාගේ උස නොසලකා හරින්න.)

ii) ගොඩනැගිල්ලේ උස සොයන්න.

b) AB රේඛාවට C සිට ඇඳි ලම්භයේ අඩිය D වේ.

$BC = 50m$ ද $AD = 20m$ ද $A\hat{B}C = 42^0$ ද වේ.

ත්‍රිකෝණමිතික වගු භාවිතයෙන්,

i) CD දිග සොයන්න.

ii) $C\hat{A}D$ හි විශාලත්වය සොයන්න.




## B කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

07. a) විදේශ සේවයේ නියුතු පුද්ගලයෙකුගේ ආරම්භක වාර්ෂික වැටුප ඇමරිකන් ඩොලර් 2400 කි. ඔහුගේ වැටුප වාර්ෂිකව ඇමරිකන් ඩොලර් 150 බැගින් වැඩිවේ.

i) ඔහු විසින් මුල් වසර හතර තුළ ලබන වාර්ෂික වැටුප් ප්‍රමාණ පිළිවෙලින් ලියා දක්වන්න.

ii) සේවය කරන අටවැනි වර්ෂයේදී ඔහු ලබන වාර්ෂික වැටුප ඇමරිකානු ඩොලර් කීයද?

iii) ඔහු සේවය කරන ලද මුල් වසර අට අවසානයේ වැටුප් වශයෙන් ලබා ඇති මුළු මුදල ඇමරිකානු ඩොලර් කීයද?

b) 2, 6, 18, 54 ................ යන සංඛ්‍යා රටාවේ හයවන පදය සූත්‍ර භාවිතයෙන් ගණනය කරන්න.

08. කවකටුවක් සහ cm / mm පරිමාණයක් සහිත සරල දාරයක් පමණක් භාවිත කර,

i) $AB = 8cm$ ක් වූ රේඛා ඛණ්ඩයක් නිර්මාණය කර එහි ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

ii) AB විෂ්කම්භයක් වන පරිදි වෘත්තයක් නිර්මාණය කර එහි කේන්ද්‍රය O යැයි නම් කරන්න.

iii) C නම් ලක්ෂ්‍යයක් ඉහත වෘත්තය මත පිහිටන සේ ද $B\hat{A}C = 60^0$ ක් වන සේ ද ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

iv) C හිදී වෘත්තයට ස්පර්ශකයක් නිර්මාණය කර ස්පර්ශකය හා BA රේඛාව P හිදී හමුවන සේ දික් කරන්න.

v) P සිට වෘත්තයට PC හැර වෙනත් ස්පර්ශකයක් නිර්මාණය කර එය PD යැයි නම් කරන්න.

09. O කේන්ද්‍රය වූ වෘත්තයේ පරිධිය මත A, B, C හා D ලක්ෂ්‍ය පිහිටා ඇත. DE යනු D හිදී වෘත්තයට ඇඳි ස්පර්ශකයකි. $D\hat{B}C = x$ වේ.

i) $D\hat{B}C$ ට සමාන කෝණ දෙකක් නම් කරන්න.

ii) $D\hat{O}C$ හා $D\hat{B}C$ අතර සම්බන්ධයක් ලියා දක්වන්න.

iii) ABCD චතුරස්‍රය සෘජුකෝණාස්‍රයක් බව සාධනය කරන්න.

iv) $x = 30^0$ නම් DOC ත්‍රිකෝණය සමපාද ත්‍රිකෝණයක් වන බව සාධනය කරන්න.

v) $x = 45^0$ නම් ABCD චතුරස්‍රය සමචතුරස්‍රයක් වන බව සාධනය කරන්න.



10. a) අරය r ද උස අරය මෙන් දෙගුණයක් ද වූ භාජනයක් තනා ඇත්තේ භාජනයේ පතුල උඩට නෙරාගිය අර්ධ ගෝලාකාර පතුලකින් සමන්විත වන සේය. (රූපය බලන්න)




i) අරය r ද උස 2r ද වූ සිලින්ඩරයක පරිමාව $\pi$ හා r ඇසුරෙන් සොයන්න.

ii) අරය r වූ අර්ධ ගෝලයක පරිමාව $\pi$ හා r ඇසුරෙන් සොයන්න.

iii) ඉහත භාජනය ජලයෙන් පුරවන ලද නම්, එම ජල පරිමාව $\frac{4}{3}\pi r^3$ ට සමාන වන බව පෙන්වන්න.

b) ලඝුගණක වගු භාවිත කොට සුළු කරන්න.

$$\frac{5.21^2 \times 0.8632}{\sqrt{7.301}}$$

11. ABCD ත්‍රපීසියමේ AB // DC වන අතර DC මත E පිහිටා ඇත්තේ AB = CE වන පරිදිය. තව ද AD = BC වේ.




i) ABCE සමාන්තරාස්‍රයක් බව සාධනය කරන්න.

ii) AD = AE බව සාධනය කරන්න.

iii) ABCD වෘත්ත චතුරස්‍රයක් වන බව සාධනය කරන්න.

12. a) A නම් භාජනයක රතුපාට වීදුරු බෝල 2 ක් ද නිල්පාට වීදුරු බෝල 3ක් ද ඇත. B න[illegible] භාජනයක රතුපාට වීදුරු බෝල 4 ක් ද නිල්පාට වීදුරු බෝල 1 ක් ද ඇත. ළමයෙක් 1 සිට[illegible] දක්වා අංක ලකුණු කර ඇති ඝනකාකාර දාදු කැටයක් ගෙන උඩ දමා ඉරට්ට සංඛ්‍යාව[illegible] ලැබුනොත් A භාජනයෙන් ද ඔත්තේ සංඛ්‍යාවක් ලැබුනොත් B භාජනයෙන් ද අහඹු ලෙ[illegible] වීදුරු බෝලයක් ඉවතට ගනු ලබයි.




i) දාදු කැටයෙන් ඉරට්ට සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව කීය ද?

ii) භාජනයකින් ඉවතට වීදුරු බෝලයක් ගැනීම හා සම්බන්ධ වියහැකි සියළු සිදුවීම් වල[illegible] අදාළ රුක් සටහනක් අඳින්න.

iii) ඉවතට ගත් වීදුරු බෝලය රතුපාට එකක් වීමේ සම්භාවිතාව කීය ද?

b) A = { $x$ ; $x$ යනු 5 ගුණාකාර, $0 < x \leq 20$ }

B = {0 සිට 20 තෙක් ඇති 2 ගුණාකාර } නම්, පහත සඳහන් කුලකවල අවයව ලියා දක්වන්න[illegible]

i) A ii) $A \cap B$ iii) $A' \cap B$